# කාර්ය සාධන හා ගිණුම්කරණ වාර්තාව

2016 වර්ෂය

## තක්සේරු දෙපාර්තමේන්තුව

මුදල් අමාත්‍යාංශය

# செயலாற்றுகையும் பொறுப்புக்கூறலும் பற்றிய

அறிக்கை 2016

## விலைமதிப்புத் திணைக்களம்

நிதி அமைச்சு

# PERFORMANCE & ACCOUNTABILITY REPORT

YEAR 2016

## DEPARTMENT OF VALUATION

MINISTRY OF FINANCE

# තක්සේරු දෙපාර්තමේන්තුව

**මුදල් අමාත්‍යාංශය**

# පටුන

**I වන කොටස - කළමනාකරණ සාකච්ඡා පත්‍රය හා විශ්ලේෂණය** ..... 4

පෙරවදන ..... 4
හැඳින්වීම ..... 5
මෙම වාර්තාව පරිශීලනය කරන ආකාරය ..... 5
අප ගැන ..... 7
**අපගේ ඉදිරි දැක්ම** ..... 7
**අපගේ මෙහෙවර** ..... 7
**අපගේ මූලික වගකීම්** ..... 7
**අපගේ අරමුණු** ..... 7
**මූලික ක්‍රියාදාමයන්** ..... 8
අභියෝග හා කළමනාකරණ උපාය මාර්ග ..... 10

**II වන කොටස - කාර්ය සාධනය සහ විශ්ලේෂණය** ..... 12

අධ්‍යාපනික උන්නතිය ..... 12
තාක්ෂණික උන්නතිය ..... 16
කාර්ය සාධන මිණුම් දඬු සහ වාර්තාකරණය ..... 16

**III වන කොටස - මූල්‍යමය කාර්යකරණය සහ විශ්ලේෂණය** ..... 30

මූල්‍යමය කාර්යකරණ මිණුම් දඬු සහ විශ්ලේෂණය ..... 30

**IV වන කොටස -අනුමත සේවක සංඛ්‍යාව හා ශ්‍රම සම්පත** ..... 31

**V වන කොටස - දේපළ වෙළඳපළ සමාලෝචනය** ..... 32

## I වන කොටස - කළමනාකරණ සාකච්ඡා පත්‍රය හා විශ්ලේෂණය

### පෙරවදන

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මෙරට සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සුවිශේෂී දායකත්වයක් සපයන බව පොදු මහජනතාව විෂයෙහි ප්‍රකට කරුණකි. මෙම දෙපාර්තමේන්තුව සපයන සේවාවන්, පළාත් පාලන ආයතනයනට අයත් දේපළ සඳහා වරිපනම් අංක වෙන්කර දීම හෝ රජයේ නිල නිවාස සඳහා ආර්ථික කුලී වටිනාකම තක්සේරු කිරීම වැනි කාර්යයන්ගේ සිට රාජ්‍ය ව්‍යාපාරික ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම අරබයා ව්‍යාපාර තක්සේරුකරණය හා අනිවාර්ය ගැනුම් බලතල යටතේ සංවර්ධන ව්‍යාපෘති සඳහා හිමිකම පවරා ගන්න ලද ඉඩම් සඳහා වන්දි මුදල් තක්සේරුකරණය වැනි කාර්යයන් දක්වා පුළුල් පරාසයක විහිදෙන්නකි.

2016 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව තුළ අප දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්ම, මෙහෙවර සහ අරමුණු හා වගකීම් මනාව පිළිබිඹු වේ. 2015 වර්ෂයට වඩා විශාල ප්‍රමාණයේ වැඩ ධාරිතාවක් සාක්ෂාත් කර ගැනීම උදෙසා අපගේ මානව හා භෞතික සම්පත දායකකර දුන් ශක්තියත්, අප දැරූ සාමූහික ප්‍රයත්නය ආශ්‍රිත උපාය මාර්ගික කාර්ය සාධනයත් ඊට සාක්ෂි දරයි.

අපගේ අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකා ජන රජයේ අතිගරු ජනාධිපති තුමන් ද ගරු මුදල් අමාත්‍ය තුමන් ද, ගරු මුදල් නියෝජ්‍ය අමාත්‍ය තුමන් ද, ගරු මුදල් රාජ්‍ය අමාත්‍ය තුමන් ද, මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා හා මුදල් අමාත්‍යාංශයේ කාර්යමණ්ඩලය ද විසින් මා වෙත හා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දක්වන ලද සහයෝගය මම ඉතා කෘතඥා පූර්වකව සිහි කරමි.

අපගේ සේවදායකයන් සමඟ සහයෝගයෙන් ඉලක්කගත කාර්යයන් සාර්ථකව ඉටුකර ගැනීම සඳහා වෙහෙස නොබලා කැපවෙමින් ඉතා ඉහළ මට්ටමේ උනන්දුවක් සහිතව සිය සේවාවන්හි නියැලි තක්සේරු දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තූතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. අපගේ වෘත්තීයමය තත්වය පවත්වා ගන්නා අතරම රාජ්‍ය ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා බැංකු යනාදිය ඇතුළත් අපගේ සේවාලාභීන් වෙත සේවය පිණිස අපි කැපවී සිටින්නෙමු. ස්වකීය අනාගත කාර්යභාරය වෙනුවෙන් මම තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මාගේ සුභාසිංශන පිරිනමමි.

**පී.ඩී.ඩී.එස්. මුතුකුමාරණ**

**රජයේ ප්‍රධාන තක්සේරුකරු**

**තක්සේරු දෙපාර්තමේන්තුව**

## හැඳින්වීම

මෙම කාර්ය සාධන හා ගිණුම්කරණ වාර්තාව, තක්සේරුකරණ හා මූල්‍ය කළමනාකරණ ක්‍රියාවලිය මුදුන්පත් කර ගැනීමට යොදා ගත් උපක්‍රම, සැලසුම් හා උපාය මාර්ග ද, මුදල් අමාත්‍යාංශයේ තක්සේරුකරණ හා මූල්‍ය පරිපාලන ක්‍රියාවලිය මුදුන්පත් කර ගැනීමට යොදා ගත් උපක්‍රම, සැලසුම් හා උපාය මාර්ග ද, මුදල් අමාත්‍යාංශය මගින් වූ අයවැය සම්පාදන හා අවසන් වශයෙන් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද කාර්ය භාරය හා සම්පත් පරිශීලනය ද ගෙනහැර දැක්වෙන අවසන් වැඩ පියවරයි. 2016 වසර තුළ දෙපාර්තමේන්තුව මගින් ඉටු කළ කාර්ය භාරය සවිස්තරාත්මකව සාකච්ඡා කෙරෙන මෙම වාර්තාව පිළියෙළ කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසිවල අවශ්‍යතාවයන්ට අනුව සහ ඊට ගැළපෙන පරිදි වේ.

## මෙම වාර්තාව පරිශීලනය කරන ආකාරය

මෙම වාර්තාවෙන් විස්තර වන්නේ 2016 වසරේ දෙපාර්මේන්තු කාර්ය සාධන නිර්ණායකයන්ගේ ප්‍රගතිය හා ගිණුම්කරණ ක්‍රියාවලිය හා ඉටුකරනු ලැබූ කාර්ය භාරය වන අතර ප්‍රගතිය ඇගයීමේදී, අත් කර ගත් ප්‍රගතිය වාර්ෂික කාර්ය සාධන සැලැස්මේ ඉලක්කගත කාර්ය භාරය සමග සංසන්දනය කරමින් සාකච්ඡා කෙරේ. මෙම වාර්තාව ප්‍රධාන කොටස් 06 කින් සමන්විත වේ.

- **කළමනාකරණ සාකච්ඡා පත්‍රය හා විශ්ලේෂණය**

  මේ යටතේ අපගේ කාර්ය සාධනය පුළුල්ව සහ 2016 වසරේ සම්පත් පරිහණය පිළිබඳව වූ විස්තර මෙන්ම, අරමුණු සාර්ථක කර ගැනීමෙහිලා ඉවහල් කරගත් උපක්‍රම, කමනාකරණ අභියෝග හා අපගේ කාර්ය සාධනයට බලපෑ බාහිර කරුණු අන්තරගත කර ඇත.

- **කාර්ය සාධන අංශය**

  මෙහිදී 2016 වසරේ කාර්ය සාධනය අපගේ දිගු කාලීන ඉලක්කගත අරමුණු සහ 2016 වසරේ ඉලක්ක කර ගත් අරමුණු, ඒවා සාක්ෂාත් කර ගැනීමෙහිලා යොදාගත් උපාය මාර්ග, එය සපුරාගත් ආකාරය මෙන්ම සපුරා ගැනීමට නොහැකි වූ අරමුණු සහ ඊට හේතු පාදක වූ කරුණු ද විශ්ල්ෂණය කරමින් සාකච්ඡාවට භාජනය කර ඇත.

- **මූල්‍ය අංශය**

  2016 වසරේ මූල්‍ය, ඒකාබද්ධ මූල්‍ය වාර්තා, මූල්‍ය ප්‍රකාශ හා සටහන් සහ ඊට අනුබද්ධ අතිරේක තොරතුරු සඳහා මෙම ශීර්ෂය යටතේ පරිශිලනය කරන්න.

- **අනුමත සේවක සංඛ්‍යාව හා මානව සම්පත**

  දෙපාර්තමේන්තුවේ මානව සම්පත පිළිබඳ ලුහුඬු විශ්ලේෂණයක් සඳහා මෙම ශීර්ෂය යටතේ පරිශීලනය කරන්න.

- **දේපළ වෙළඳපළ විග්‍රහය**

  ශ්‍රී ලංකාවේ දේපළ වෙළඳපොළ පිළිබඳ ප්‍රධාන තක්සේරුකරුගේ විග්‍රහය සඳහා මෙම ශීර්ෂය යටතේ පරිශීලනය කරන්න.

**අප ගැන........**

**අපගේ ඉදිරි දැක්ම**

"නිශ්චල දේපළ තක්සේරුකරණ සහ කළමනාකරණ විෂයයෙහිලා ගෝලීය ප්‍රමිතීන් පදනම් වූ ප්‍රශස්ත වෘත්තීයමය සේවාවන් තුළින් සමාජ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම"

**අපගේ මෙහෙවර**

"කාර්යක්ෂම හා ඵලදායී කළමනාකරණ ව්‍යුහයක් තුළින් තරඟකාරීව මෙන්ම පිරිවැය පිළිබඳ සවිඥාණිකව ශ්‍රී ලංකා රජයට පූර්ණ වෘත්තීයමය තක්සේරු හා දේපළ කළමනාකරණ සේවාවන් සැපයීම."

**අපගේ මූලික වගකීම්**

"රාජ්‍ය හා අනුබද්ධ ආයතන උදෙසා තක්සේරු සේවාවන් හා දේපළ කළමනාකරණ උපදේශක සේවාවන් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සපයනු ලැබේ."

**අපගේ අරමුණු**

"මෙම දෙපාර්තමේන්තුවේ අරමුණු වනුයේ සේවාදායකයින් වෙත ප්‍රතිඵල සාධනය ඉලක්ක කරගත් විශිෂ්ටතම කාර්ය චර්යා ප්‍රමිතීන් මත පිහිටා උසස් වෘත්තීයමය සේවාවන් සැපයීමයි."

## මූලික ක්‍රියාදාමයන්

දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය සම්බන්ධයෙන් පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඇතුළුව රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන සේවාවන් ප්‍රධාන වශයෙන් පහත සඳහන් අයුරින් වර්ගීකරණය කළ හැකි ය.

(අ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ පුද්ගලික දේපළ පොදු කටයුතු සඳහා අත්කර ගන්නා විට, එම පනත යටතේ ගෙවිය යුතු වන්දි හා තක්සේරු වාර්තා පිළියෙළ කරනු ලබන අතර, හදිසි අත්කර ගැනීමක දී මෙම පනතේ 38 (අ) වගන්තිය යටතේ තත්ත්ව වාර්තා පිළියෙළ කිරීම ද සිදු කරනු ලැබේ.

(ආ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ යථා කාලයේදී දේපළ අත්කර ගැනීමේ අරමුණින් මුදල් ප්‍රතිපාදනයන් වෙන්කර ගැනීම උදෙසා දේපළ ඇස්තමේන්තු කටයුතු කරනු ලැබේ.

(ඇ) පුද්ගලික ගිවිසුම් මත දේපළ මිලදී ගැනීම සහ සන්තකය බැහැර කිරීම, ගිණුම් කටයුතු මෙන්ම බදු කාර්යයන් උදෙසා සහ වෙනත් විවිධ කාරයයන් සඳහා චංචල හා නිශ්චල දේපළ තක්සේරු කරනු ලබයි.

(ඈ) රජයේ හා රාජ්‍ය ආයතනවල දේපළ කුළියට දීම සහ පුද්ගලික දේපළ රජයට සහ රාජ්‍ය අනුබද්ධ ආයතනවල පරිහරණය සඳහා අවශ්‍ය වූ විට, ඒ සඳහා කුලී තක්සේරු සපයනු ලැබේ.

(ඉ) කොළඹ මහනගර සභා සීමාව තුළ පිහිටි දේපළ හැර දිවයිනේ වරිපනම් බදු අය කෙරෙන සියලුම පළාත් පාලන ආයතනයන්ට අයත් දේපළ, ප්‍රාදේශීය වරිපනම් බදු අය කිරීමේ කාර්යය උදෙසා තක්සේරු කරනු ලබන අතර, අතෘප්තිමත් පුද්ගලයින් විසින් වරිපනම් තක්සේරු වලට එරෙහිව ඉදිරිපත් කෙරෙන විරෝධතා පිළිබඳ නිශ්චය කිරීමේ දී වෘත්තීය සහය  දැක්වීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

(ඊ) විශේෂයෙන් ශ්‍රී ලංකා විනිමය සුරැකුම්පත් කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩය වැනි ආයතන වෙත වත්කම්  තක්සේරුකරණය හා නිශ්චල දේපළ කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක සේවාවන් සැපයීම හා එම

අංශයන්හි දැනුම වැඩිදියුණු කිරීම උදෙසා අවශ්‍ය කටයුතු ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

(උ) වන්දි මුදල් හා තක්සේරු ආරවුල් විභාග කර විසඳුම් ලබා දෙන අධිකරණවලට හා විවිධ වන්දි විනිශ්චය සභාවලට විශේෂඥ සාක්ෂ්‍ය සැපයීම මගින් සහය වන අතර දෙපාර්තමේන්තු නිලධාරීන්, ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින් ගෙවල් කුලී පනත යටතේ ස්ථාපිත ගෙවල් කුලී මණ්ඩලවල (කොළඹ මහ නගරසභා සීමා බල ප්‍රදේශය තුළ හැර, අනෙකුත් ගෙවල් කුලී මණ්ඩලවල) රැස්වීම්වලට නිල ලත් සාමජිකයන් වශයෙන් සහභාගි වේ.

(ඌ) මහ භාණ්ඩාගාරයේ ඉල්ලීම මත, රාජ්‍ය ව්‍යවසායන් සඳහා ව්‍යාපාර තක්සේරු කටයුතු සිදු කරනු ලැබේ.

(ඔ) කොළඹ මහ නගර සභා සීමාව තුළ පිහිටි රාජ්‍ය දේපළවල වාර්ෂික වටිනාකම් ප්‍රධාන තක්සේරුකරුගේ අනුමැතිය සහිතව කොළඹ මහ නගර සභාව විසින් තක්සේරු කරනු ලැබේ.

(ඕ) රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල ගිණුම්කරණ කාර්යයන් සඳහා වත්කම් තක්සේරු කිරීම.

## අභියෝග හා කළමනාකරණ උපාය මාර්ග

මෙම අංශය විෂයයෙහි ගෙනහැර දක්වනු ලබන අභියෝග හා උපාය මාර්ග, තක්ස්රුකරණයේ ක්‍රම සහ මුල්‍ය වර්තාකරණය යන කරුණු සම්බන්ධයෙන් වන්නාවූ අභ්‍යන්තර පාලනයේ කාර්යක්ෂමතාව පිළිබඳ තක්සේරුවක් සිදු කරන ලදී. එම ප්‍රයත්නය තුළින්, අදාළ දුර්වලතා පිටු දැක නිසි ගිණුම්කණමය හා වාර්තාකරණමය කාර්ය සාධනයක් සහතික වනු පිණිස නිවැරදි හා කාර්යක්ෂම ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම තුළින් ඒවා වැඩිදියුණු කිරීමේ ක්‍රියාදාමය අඛණ්ඩව පවත්වා ගැනේ. සමාලෝචිත 2016 වසර මුළුල්ලේම තක්සේරු දෙපාර්තමේන්තුව ස්වකීය කාර්ය සාධන දත්ත අදාළ වසර තුළ ඉටු කරන ලද තක්සේරු කිරීම් මත පිහිටා විශ්ලේෂණයට හසු කිරීම මගින් ආයතනයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව මැන බලන අතර දෙපාර්තමේන්තුවේ තක්සේරුකරණ කාර්ය සාධන ක්ෂේත්‍රය තුළ උද්ගත වන අඩුපාඩු හඳුනා ගනිමින් ඒවා පිටු දැකීම සඳහා අවශ්‍ය වන්නාවූ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හඳුනා ගැනීම පිණිස මෙම දත්ත උපයෝගි කර ගනියි.

අප විසින් සලසා දෙනු ලබන සේවය ප්‍රධාන වශයෙන් කළමනාකරණයේ ඵලදායිතා හා කාර්යක්ෂමතා මට්ටම කෙරෙහි අනුගතව පවතී. අපගේ හරාත්මක නීතිමය බලසීමා සම්බන්ධයෙන් ප්‍රති අවධානය යොමු කෙරෙන විධිමත් අගැයුම් උපාය මාර්ග සංවර්ධනය කරගැනීම පිණිස වූ අප ආයතනය සතු හැකියාව මීට හේතු කාරක වන්නේය. අපගේ ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳව විශ්ලේෂණය කෙරෙන නිසි හා විධිමත් කාර්ය සාධන අගැයුම් ක්‍රමවේදයක් නොමැති වීම අද දින ප්‍රමුඛ ගැටලුවක් බවට පත්ව තිබේ.

අපගේ කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමේ අරමුණ පෙරදැරිව අපගේ අභ්‍යන්තර හා බාහිර දක්ෂතා, අභියෝගතා, අවස්ථා හා තර්ජන අගැයුමට ලක් කිරීම මගින් අප ආයතනය සම්බන්ධයෙන් කරුණු මැන බැලීම ඉලක්ක කර ගත් සංවිධානමය කළමනාකණ ක්‍රමවේදයක් පිළිබඳව සාපේක්ෂ වශයෙන් වූ අභිනව සංකල්පයක් අප විසින් උපයෝගි කරගනු ලැබිය යුතු වන්නේය. ප්‍රමුඛ වශයෙන්, වඩා ශක්තිමත් ක්ෂේත්‍ර හා වැඩිමනත් අවස්ථා පවත්නා ක්ෂේත්‍ර වෙත අපගේ ක්‍රියාදාමය යොමු කිරීමට අපට පුළුවන. තක්සේරුකරණය හා දේපළ කළමනාකරණය යන ක්‍රියාදාම පරාසය තුළ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලට සේවා සලසන අද්විතීය රාජ්‍ය ආයතනයක් වන අප ඉදිරියේ පුළුල් වෙළඳපළක් ඒ සඳහා විවෘතව පවතී.

දෙපාර්තමේන්තුව තුළ ප්‍රමුඛ ස්ථනවල සුදුසු කාර්ය මණ්ඩල සේවයෙහි නිරතව සිටීම අප සතු මහඟු වත්කමකි. දෙපාර්තමේන්තුවේ තක්සේරු සේවක මණ්ඩලය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ දේපළ කළමනාකරණය සහ තක්ස්රුකරණය පිළිබඳ විශේෂ උපාධිධාරින් වන අතර නව ප්‍රගුණතා අනුව කටයුතු කිරීම සඳහා සියලුම සේවක කාර්යමණ්ඩල අවශ්‍ය දැනුමෙන් හා නිපුණතවයෙන් පරිපූර්ණව සිටිති. ඉතා ඉහළ වෘත්තීමය තත්වයක් ලඟාකර ගැනීමට හැකි වනු පිණිස රාජකීය වරලත් මිනින්දෝරු

ආයතනයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන නියෝග අනුව කටයුතු කරමින් ස්වකීය සේවා කාලය තුල අවශ්‍ය වන්නාවූ දැනුම හා ප්‍රවීණතාවය යාවත්කාලීන කරගනු සඳහා රාජකීය වරලත් මිනින්දෝරු ආයතනයේ ආශ්‍රය සාමාජිකත්වය ලබා ගැනීම උදෙසා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් කඩිනම් මාර්ගයක් අදාළ කාර්ය මණ්ඩල වෙත සලසා දී තිබේ. මෙම විශ්ව විද්‍යාල ආයතනයේම දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා දිස්ත්‍රික් තක්සේරුකරුවනට හා සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවනට මෙම දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය අරමුදල් ද සපයා දී තිබේ. තක්සේරුකරණය පිළිබඳව ස්වකීය දැනුම යාවත්කාලීන කර ගනු පිණිස තක්සේරු කාර්ය මණ්ඩලය උදෙසා ධාරිතා වර්ධන වැඩසටහන් ද කලින් කල පවත්වනු ලැබ්.

## II වන කොටස - කාර්ය සාධනය සහ විශ්ලේෂණය

### අධ්‍යාපනික උන්නතිය

### නිපුණතා සංවර්ධන කේන්ද්‍රය

දැනුම, ආකල්ප හා කාර්යක්ෂමතාවය තේමාකර ගනිමින් සහ තිර ජීවන අධ්‍යාපනය තුළින් (Life Long Learning) සේවක අභිමානය යන මූලධර්මයත්, අභිප්‍රේරණය, කාර්ය සාධනය ඇගයීම සහ කුසලතා සංවර්ධනය තුළින් සේවක කාර්යක්ෂමතාව හා කැපවීම යන මූලධර්මයත් සැලකිල්ලට ගනිමින් 2006 වසරේදී නිපුණතා සංවර්ධන කේන්ද්‍රය ස්ථාපනය කරන ලදී. තක්සේරු දෙපර්තමේන්තුව තුළ නිපුණතා සංවර්ධන කේන්ද්‍රය පිහිටුවා ඇත්තේ එහි සියලුම කාර්ය මණ්ඩලවල දැනුම වර්ධනය කිරීමේ පුළුල් පරමාර්ථයෙනි. මෙම නිපුණතා සංවර්ධන හා පුහුණු කේන්ද්‍රය තක්සේරු දෙපාර්තමේන්තුවේ ආරම්භයත් සමගම පුහුණු පාසලක් වශයෙන් බිහිවූ එකකි. පුහුණුව ආශ්‍රිත ක්ෂේත්‍රයෙහි ඉල්ලුම ක්‍රමයෙන් වර්ධනය වීම නිසා ඊට අදාළ සංකල්ප වෙනස් කිරීම් වලට භාජනය කෙරුණු අතර මෙම පුහුණු පාසල නව ප්‍රවනතාවලට ප්‍රතිචාර දක්වන නවෝත්පාදක වැඩසටහන් ඉදිරිපත් කරන්නාවූ විද්‍යායතනයක් බවට පත්විය. පසුගිය වසර කීපය මුළුල්ලේ මෙම විද්‍යායතනය මූලාමය වශයෙන් ලාභදායි හා ලාභදායි නොවන පුහුණු වැඩසටහන් ගණනාවක් දෙපාර්තම්න්තුවේ ඉහළ මට්ටමේ සිට පහළ මට්ටම දක්වා වූ කළමනාරණය වෙතද, බාහිර පර්ශවයන් වෙතද දියත් කර හරිනු ලැබ තිබේ..

දෙපර්තමේන්තුවේ ඉහළ කළමනාකරණයේ සිට සහයක ශ්‍රේණිවල කාර්ය මණ්ඩලය දක්වා විහිදී යන පරිදි දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ දැනුම ආකල්ප හා කර්යක්ෂමතාව වර්ධනය කිරීම තුළින් වෘත්තීය විශිෂ්ඨත්වය ලඟාකර ගැනීමේ අරමුණු පෙරදැරි කරගෙන නිපුණතා සංවර්ධන කේන්ද්‍රය විසින් පුහුණු වැඩසටහන් සංවිධානය හා මෙහයවීම සිදු කරයි.

නිපුණතා සංවර්ධනය කේන්ද්‍රය විසින් මෙහයවනු ලබන පුහුණු වැඩසටහන් ප්‍රධාන අංශ දෙකක් යටතේ පහත සඳහන් පරිදි වර්ගීකණය කළ හැකිය.

- අභ්‍යාන්තර පුහුණු වැඩසටහන්
- බාහිර පුහුණු වැඩසටහන්

නිපුණතා සංවර්ධන කේන්ද්‍රය මගින් මෙහෙයවනු ලබන මෙම වැඩසටහන් ඒවා අයත් විවිධ විෂය පථයන් අනුව තවදුරටත් වර්ගීකරණය කර ඇති අතර පහත සඳහන් පරිදි ගෙනහැර දැක්විය හැකිය.

- අභ්‍යන්තර පුහුණු වැඩසටහන් (අභ්‍යන්තර වෘත්තීය නිලධාරීන් සහ කළමනාකරණ සේවක පිරිස් සඳහා)
    - අ. රැකියා නැඹුරුවක් සහිත පුහුණු වැඩසහන්
    - ආ. විෂය කේන්ද්‍රකොට ගත් පුහුණු වැඩසටහන් හා වැඩමුළු
    - ඉ. විභාග ඉලක්ක කොටගත් පුහුණු සැසි හා වැඩමුළු
    - ඊ. දැනුම හුවමාරු කර ගැනීමේ වැඩමුළු

- බාහිර පුහුණු වැඩසටහන්
    - අ. පළාත් පාලන නිලධාරින් සඳහා පුහුණු සැසිවාර
    - ආ. පළාත් ආදායම් නිලධාරින් සඳහා පුහුණු සැසිවාර හා වැඩමුළු
    - ඇ. දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි අපේක්ෂකයන් සඳහා වෘත්තීය අනුබද්ධ වැඩසටහන්
    - ඈ. අත්කර ගැනීමේ නිලධාරින් සඳහා වන වැඩමුළු හා පුහුණු සැසිවාර
    - ඉ. අවශ්‍යතා අනුව විශේෂයන්ම සැකසුණු පුහුණු වැඩසහන්

## පුහුණු පහසුකම් හා අනුග්‍රහිත පුහුණු වැඩසටහන් 2016

### I. වෙනත් ආයතනවල අවශ්‍යතා අනුව විශේෂයෙන් සැකසුන පුහුණු වැඩසටහන්

<u>දේපළ කළමනාකරණය හා තක්සේරුකරණය පිළිබඳ තෙවන වසර විද්‍යාවේදී උපාධි අපේක්ෂකයින් සඳහා ප්‍රායෝගික පුහුණු වැඩසටහන</u>

මූලික ක්ෂේත්‍ර පරීක්ෂණය ආරම්භ කිරීමේ සිට තක්සේරු වාර්තාව පිළියෙළ කිරීම දක්වා වන න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික ක්‍රියාවලිය ආවරණය වන පරිදි දින 10 ක කාලයක් තුළ පැවැති අදාළ අවශ්‍යතාව සඳහාම සැකසුණු වැඩසටහනක් උපාධි අපේක්ෂකයින් 160 දෙනෙකුගේ සහභාගිත්වයෙන් 2016 වසර තුළ පැවැත්විණි.

### II. අභ්‍යන්තර නිලධාරින් සඳහා වූ පුහුණු වැඩසටහන්

<u>දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා වූ පුහුණු වැඩසහන</u>

දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් තක්සේරුකරුවන් 65 දෙනෙකු සඳහා එක් දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

දෙපාර්තමේන්තුව් සියලුම තක්සේරුකරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන

දෙපාර්තමේන්තුවේ සියලුම තක්සේරුකරුවන් සඳහා එක් දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

පළාත් තක්සේරුකරුවන් හා දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා වූ පුහුණු වැඩසටහන

පළාත් තක්සේරුකරුවන් හා දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය පිළිබඳ දැනුම දියුණු කිරීම පිණිස වූ එක් දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

## III. විභාග ඉලක්ක ගත පුහුණු වැඩසටහන්

සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග ඉලක්ක කොටගත් පුහුණු වැඩසටහන

තක්සේරු සේවයේ II පන්තිය II ශ්‍රේණිය සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා නියමිත ඔවුන්ගේ I වන හා II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය වෙනුවෙන් අදාළ නිලධාරින් පෙර සුදානම් කිරීමක් වශයෙන් සය දිනක් පුරා තත්ත්ව වාර්තා පිළියෙළ කිරීම, වරිපනම් තක්සේරු, පරිපාලනය හා මුල්‍ය, ප්‍රාග්ධන තක්සේරුකරණය, දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය හා පරිපාලනය හා විශේෂ කාර්යයක් සඳහා යම් දේපළක් වෙනුවෙන් සවිස්තරාත්මක තක්සේරු වාර්තා පිළියෙළ කිරීම යන විෂය ක්ෂේත්‍ර ආවරණය කෙරෙමින් පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක විය.

දිස්ත්‍රික් තක්සේරුකරුවන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග ඉලක්ක කොටගත් පුහුණු වැඩසටහන

තක්සේරු සේවයේ I පන්තිය II ශ්‍රේණිය දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා නියමිත ඔවුන්ගේ I වන හා II වන කාර්යක්ෂමතා කඩඉම් විභාග වෙනුවෙන් අදාළ නිලධාරින් පෙර සුදානම් කිරීමක් වශයෙන් උසස් තක්සේරුකරණය හා ඉඩම් අත්පත් කර ගැනීම යන විෂය ක්ෂේත්‍ර ආවරණය කරමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක විය.

## IV. අභ්‍යන්තර නිලධාරින් සඳහා බාහිර වැඩසටහන්

දේපළ කළමනාකරණ හා තක්සේරු විද්‍යා පශ්චාත් උපාධි වැඩසටහන්

එක්සත් රාජධානියේ රෙඩින් විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන ඉහත පාඨමලාව සඳහා එක් දිස්ත්‍රික් තක්සේරුකරුවකු සහභාගි කරවන ලදී.

<u>රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව</u>

මෙම පාඨමලාව සඳහා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරුවකු හා දිස්ත්‍රික් තක්සේරුකරුවකු සහභාගී කරවන ලදී.

<u>තොරතුරු තාක්ෂණමය විධායක නොවන නිලධාරීන් සඳහා අත්‍යවශ්‍ය තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන</u>

ඉහත පාඨමලාව සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරු සහ අතිරේක ප්‍රධාන තක්සේරුකරු යන නිලධරයන් සහභාගී කරවන ලදී.

<u>රාජ්‍ය ප්‍රසම්පාදනය හා ප්‍රතිපත්තිය සහ මාර්ගෝපදේශ පිළිබඳ පුහුණු වැඩසටහන</u>

අදාළ විෂය දැනුම වර්ධනය පිණිස ඉහත වැඩසටහන සඳහා නිලධාරීන් තිදෙනෙකු සහභාගී විය.

<u>මූල්‍ය වෙළඳපළ හඳුන්වාදීම පිළිබඳ පුහුණු වැඩසටහන</u>

සංවිධාන චර්යා, දෙපර්තමේන්තුමය නියෝග හා චක්‍රලේඛ යනාදිය පිළිබඳ විෂය දැනුම වර්ධනය පිණිස වූ මෙම පුහුණු වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක සහභාගී විය.

<u>ආයතන සංග්‍රහය සහ එය යොදා ගැනීම පිළිබඳ පුහුණු වැඩසහන</u>

මෙම එක් දින පුහුණු වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුවේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් සහභාගී විය.

<u>සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් සඳහා වූ වැඩමුළුව</u>

දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරීන් සඳහා නායකත්වය පිළිබඳ තේමාව යටතේ 'හයි බ්‍රෑන්ඩ් ටීම්' ආයතනය විසින් පවත්වන ලද වැඩමුළුවට සහකාර දිස්ත්‍රික් තක්සේරුකරුවන් සහභාගී විය.

<u>කළමනාකරණය හා විගණනය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන</u>

සිය විෂය දැනුම වර්ධනය පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක මෙම පුහුණු වැඩසටහනට සහභාගී විය.

## තාක්ෂණික උන්නතිය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, නූතන ප්‍රවනතා සමඟ යමින් රාජ්‍ය විද්‍යුත් ප්‍රතිපත්තියේ අරමුණ සපුරාලීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ සේවාවන් ගෝලීය ප්‍රමිතීන් හා අධි වෘත්තීය තත්වය ආරක්ෂා වන පරිදි කටයුතු කරන ලදී.

<u>දෙපාර්තමේන්තුමය වෙබ් අඩවිය සංවර්ධනය කිරීම</u>

තක්සේරු දෙපර්තමේන්තුව රාජ්‍ය විද්‍යුත් ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයන් අනුව කටයුතු කරමින් දෙපාර්තමේන්තුවට අයත් වෙබ් අඩවිය ප්‍රතිව්‍යුහගත කිරීමේ අදියරෙහි නිරතව සිටින අතර ඉතා ඉක්මණින් කාර්යක්ෂම සංනිවේදනයක් ඇති කිරීමේ හා මහජනයා වෙත තොරතුරු ප්‍රවේශ කරවීමේ අභිලාෂය සහිත විද්‍යුත් වේදිකාවක් බිහි කිරීමේ ප්‍රයත්නයෙහිලා සත්කාරකත්වයක් සපයනු ඇත. මෙමගින් පොදු මහජනතාවට සිය අවශ්‍යතාවයන් සපුරා ගැනීම පිණිස පහසුවෙන් අන්තර් ක්‍රියාකාරී ලෙස කටයුතු කළ හැකි වන හෙයින් එය විනිවිදභාවයේත්, ප්‍රජාතන්ත්‍රීයකරණයේත් බෙහෙවින් ප්‍රයෝජනවත් වන්නාවූ මෙවලමක් වනු ඇත. මහජනතාව වත සපයා දෙනු ලැබිය හැකි අනෙකුත් වැදගත් රාජ්‍ය විද්‍යුත් සේවා පහසුකම් සැලසීමේ කටයුතු දැනට මූලික බිම් මට්ටමෙහි පවතී.

## කාර්ය සාධන මිණුම් දඬු සහ වාර්තාකරණය

I. <u>ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ තක්සේරු කිරීම</u>

2016 වසරේදී දෙපාර්තමේන්තුව විසින් 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමේ නිලධාරීන් විසින් 17 (1) වගන්තිය ප්‍රකාර කළ යුතු වන්දි ප්‍රදානයන් උදෙසා ඒකක 20,045 ක තක්සේරු වාර්තා නිම කර ඇති අතර එම පනතේ 38 (අ) වගන්තිය මත රජයට පවරා දෙනු ලැබ ඇති ඉඩම් 23,389 ක් උදෙසා තත්ත්ව වාර්තා පිළියෙළ කර ඇත.

II. <u>අනිවාර්ය ඉඩම් ගැනුම්වලට අදාළ දේපළ ඇස්තමේන්තු කිරීම</u>

1950 අංක 9 දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ අත්කර ගැනීමට යෝජිත ඉඩම් අත්කර ගැනීම් කාර්යය වනුවෙන් මුදල් වෙන්කර ගැනීම සඳහා 2016 වසර තුළ දේපළ 1,032 ක් ඇස්තමේන්තු කර ඇත.

III. <u>රාජ්‍ය ආයතන හා රාජ්‍ය අංශයේ සංස්ථා සහ මණ්ඩල යනාදිය වෙනුවෙන් තක්සේරු කිරීම.</u>

2016 වසර තුළ රජයේ හා රාජ්‍ය ආයතන සතු දේපළ 41,897 ක් තක්සේරු කර ඇත.

IV. අල්ලස් පනත යටතේ තක්සේරු කිරීම

2016 වසර තුළ දෙපාර්තමේන්තුව අල්ලස් පනත යටත් අල්ලස් කොමසාරිස් වෙත තක්සේරු වාර්තා 09 ක් සපයා ඇත.

V. මුද්දර බදු සඳහා තක්සේරු කිරීම

මුද්දර බදු සම්බන්ධ කාර්යයන් පිණිස දේපළ 336 ක් සඳහා වූ තක්සේරු කටයුතු නිම කර ඇත.

VI. රජය සතු දේපළ සඳහා මාසික කුලී හා වෙනත් බදු කුලී තීරණය කිරීම

ආයතන සංග්‍රහයේ XIX වන පරිච්ඡේදයේ 5:1 සහ 7:1 යන වගන්ති යටතේ නියම කළ යුතු ආර්ථික කුලී හා දණ්ඩන කුලී අය කිරීම් උදෙසා කුලී තක්සේරු වාර්තා 4,137 ක් 2016 වසර තුළ වාර්තා කොට ඇත.


VII. කුලී තක්සේරු කිරීම

2016 වසර තුළ විවිධ රාජ්‍ය ආයතනවල පරිහරණය සඳහා වූ දේපළ 8,912 ක් සම්බන්ධයෙන් කුලී වර්තා පිළියෙළ කර ඇත.

සමාලෝචිත වසර තුළ දෙපාර්තමේන්තු නිලධාරින් ප්‍රධාන තක්සේරුකරු නියෝජනය කරමින් දිවයින පුරා පැවති ගෙවල් කුලී මණ්ඩල රුස්වීම් වාර 625 ක් සඳහා සහභාගි වී ඇත.

## නිමකළ සාමාන්‍ය තක්සේරු වාර්තා (වර්ෂමය හා ඉලක්කගත)

| තක්සේරු වර්ගය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 ප්‍රක්ෂේපිත |
|---|---|---|---|---|---|---|
| තත්ත්ව වාර්තා | 6693 | 13818 | 22877 | 8092 | 23389 | 20000 |
| ඉඩම් අත්කර ගැනීම් | 8366 | 9320 | 16476 | 15639 | 20045 | 31500 |
| ඉඩම් ඇස්තමේන්තු | 1628 | 1423 | 1243 | 648 | 1032 | 600 |
| ඉඩම් විවිධ | 29820 | 58563 | 48174 | 33222 | 41987 | 30000 |
| අල්ලස් කොමසාරිස් | 11 | 17 | 3 | 10 | 9 | |
| මුද්දර ගාස්තු | 595 | 472 | 341 | 165 | 336 | 375 |
| කුලී පුද්ගලික | 5686 | 6851 | 6067 | 7619 | 8912 | 8000 |
| කුලී රජය | 5925 | 5159 | 4521 | 4094 | 4137 | 4000 |





* මුද්දර බදු සහ අල්ලස් කොමසාරිස් වෙත වාර්තා පෙන්නුම් කර නොමැත.

## සාමාන්‍ය තක්සේරු

**2016 ඉලක්ක ගත < 2016 නිම කළ > 2017 ප්‍රක්ෂේපිත**

| | 2016 ඉලක්ක ගත | 2016 නිම කළ | 2017 ප්‍රක්ෂේපිත |
|---|---|---|---|
| තත්ත්ව වාර්තා | 32000 | 23389 | 20000 |
| ඉඩම් අත්කර ගැනීම් | 20000 | 20045 | 31500 |
| ඉඩම් ඇස්තමේන්තු | 1000 | 1032 | 600 |
| ඉඩම් විවිධ | 40000 | 41987 | 30000 |
| කුලී පුද්ගලික | 7000 | 8912 | 8000 |
| කුලී රජය | 4000 | 4132 | 4000 |

**සාමාන්‍ය තක්සේරු**
**2016 ඉලක්ක ගත < 2016 නිම කළ > 2017 පුරෝකථනමය**




**VIII.** <u>වරිපනම් තක්සේරු සාරාංශය</u>

පළාත් පාලන ආයතන, එනම් මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා සඳහා වරිපනම් බදු සහ ඊට අදාළ පශ්චාත් තක්සේරු ගාස්තු අය කිරීම සඳහා 2016 වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් නිම කළ වරිපනම් තක්සේරු හා පශ්චාත් වරිපනම් තක්සේරු සැලකිය යුතු විශාල ප්‍රමාණයක් වූ අතර එහි සාරාංශයක් පහත දැක්වේ.

**ප්‍රති වරිපනම් තක්සේරු කටයුතු**

**වසරමය සහ 2016 ප්‍රක්ෂේපිත**

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 ප්‍රක්ෂේපිත |
|---|---|---|---|---|---|---|
| මූලික සමීක්ෂණ | 279,357 | 243,390 | 184,675 | 119,539 | 173,619 | 400,000 |
| අවසන් පරීක්ෂා කිරීම | 243,726 | 203,702 | 180,548 | 150,455 | 166,155 | 400,000 |




## වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනය

**2016 ඉලක්ක ගත < 2016 නිම කළ > 2017 ප්‍රක්ෂේපිත**


| | 2016 ඉලක්ක ගත | 2016 නිම කළ | 2017 පුරෝකථනමය |
|---|---|---|---|
| මූලික සමීක්ෂණ | 300,000 | **173,619** | 400,000 |
| අවසන් පරීක්ෂා කිරීම | 300,000 | **166,155** | 400,000 |

**වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනය**
**2016 ඉලක්ක ගත < 2016 නිම කළ > 2017 ප්‍රක්ෂේපිත**



## වරිපනම් තක්සේරු කටයුතු ආශ්‍රිත ගිණුම

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 පුරෝකථනමය |
|---|---|---|---|---|---|---|
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන | 32,596 | 31,133 | 26,290 | 25,919 | 28,769 | 28000 |
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන ගොඩනැගිලි | 2,152 | 1,676 | 2,227 | 1,499 | 1,680 | 2000 |
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන විරෝධතා | 9,393 | 10,665 | 8,451 | 5,149 | 2,512 | 8000 |




## වරිපනම් තක්සේරු ප්‍රතිශෝධනය

**2016 ඉලක්ක ගත < 2016 නිම කළ > 2016 ප්‍රක්ෂේපිත**

| | 2016 ඉලක්ක ගත | 2016 නිම කළ | 2017 ප්‍රක්ෂේපිත |
|---|---|---|---|
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන ඉඩම් | 25000 | 28,769 | 28,000 |
| වරිපනම් තක්සේරු ප්‍රතිශෝධන ගොඩනැගිලි | 2500 | 1,680 | 2,000 |
| වරිපනම් තක්සේරු විරෝධතා | 3000 | 2,512 | 8,000 |

**වරිපනම් තක්සේරු ආශ්‍රිත කටයුතු**
**2016 ඉලක්ක ගත < 2016 නිම කළ > 2016 ප්‍රක්ෂේපිත**




IX. <u>ඉඩම් අත්පත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ කටයුතු පිළිබඳ ලුහුඬු විස්තරය</u>

දෙපාර්තමේන්තුවේ නීති අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ස්ථාපිත ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය වෙත, දේපළ අත් කර ගැනීම යටතේ වන්දි මුදල් ප්‍රමාණවත් නොවූ අගතියට පත් පාර්ශවයන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳ ආයතන කටයුතු හා ඒ සඳහා රජය වෙනුවෙන් සාක්ෂි මෙහයවීම වන අතර ඉඩම් අත් කර ගැනීමේ සමාලෝචන මණ්ඩලයේ අභියාචනා කළමනාකරණ කටයුතු පහත පරිදි වේ.

**අභියාචනා කළමනාකරණ ගිණුම**


**ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය**

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| වසර මුල ඉතිරිය | 1161 | 2088 | 978 | 2216 | 178 |
| වසර තුළ ලද සංඛ්‍යාව | 325 | 245 | 429 | 558 | 215 |



## ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය විසින් නිම කරන ලද අභියාචනා සාරාංශය

| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| විභාග අසා නිම කළ | **297** | **279** | 256 | 282 | 214 |
| මූලික විභාගයෙන් පසුව අවසන් කළ | **143** | **61** | 18 | 19 | 107 |
| ඉල්ලා අස්කර ගත් අභියාචනා | **106** | **52** | 52 | 89 | 75 |
| සමථයට පත් කළ | **42** | **81** | 114 | 176 | |
| ප්‍රතික්ෂේපිත අභියාචනා | **96** | **85** | 115 | 282 | 32 |



## රාජ්‍ය වත්කම් තක්සේරු කිරීම

රජයේ අයිතිය යටතේ පවත්නා සියලුම නිශ්චල දේපළ තක්සේරු කිරීමේ කාර්ය භාරය තක්සේරු දෙපාර්තමේන්තුව වෙත පවරා දෙනු ලැබ ඇති අතර එම ක්‍රියාදාමය ඒ සඳහාම ස්ථාපනය කළ රාජ්‍ය වත්කම් තක්සේරු කිරීමේ ඒකකය මගින් කඩිනම් ව්‍යාපෘතියක් ලෙස අතිරේක කාර්ය මණ්ඩල ද බඳවා ගනිමින් ඔවුන්ගේ ද සහය ඇතිව ඉටු කරනු ලැබේ. ගත වූ 2012 සහ 2016 අතර කාල පරිච්ඡේදය තුළ අමාත්‍යාංශ 77 කට අයත් මුළු දෙපළ ඒකක 6,608 කට අදාළ වත්කම් තක්සේරු කිරීමේ කාර්යය දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද අතර 2016 වසර වන විට ඉන් දේපළ ඒකක 6279 ක තක්සේරු කටයුතු සාර්ථක ලෙස නිම කර ඊට අදාළ වාර්තා ද සපයා දෙනු ලැබ ඇත. තවදුරටත් දේපළ ඒකක 324 කට අයත් තක්සේරු කටයුතු ඉදිරියේදී නිම කිරීමට ඉතිරිව පවතී.

## තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2016 වසර තුල ඉටු කරන ලද විශේෂ ව්‍යාපෘති වල සාරාංශය

මෑත වර්ෂ කීපය තුළ ශ්‍රී ලංකාවේ රාෂ්ටිය සන්දර්භය තුළ සිදුවූ වෙනස්කම් බොහෝය. රාජ්‍ය ප්‍රතිපත්ති වලට හා ආර්ථික ප්‍රතිසංස්කරණ වලට අනුගත වෙමින් රටේ ආර්ථික ප්‍රවර්ධනය සඳහා රජය විසින් විවිධ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර ඇත. එම සංවර්ධන ක්‍රියාවලිය බාධා විරහිතව ක්‍රියාවට නැංවීම පිණිස ශ්‍රී ලංකා රජය වෙත පරිපූර්ණ අධි වෘත්තීයමය තක්සේරුකරණ හා දේපළ කළමනාකරණ සේවා මහ පරිමාණ වශයෙන් සලසා දීම අරබයා තක්සේරු දෙපාර්තමේන්තුව සම්බන්ධ වූ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් අතර දිවයින පුරා විවිධ විශේෂ අංශ ආශ්‍රිතව බිහිවූ ව්‍යාපාරික හා තාක්ෂණික සංවර්ධන ප්‍රදේශ, ජාතික ආර්ථිකය හා ජාතික ප්‍රවාහන පද්ධතිය දියුණු කිරීම සඳහා වූ මහා මාර්ග ව්‍යාපෘති මෙන්ම සංචාරක කලාපවල සිදු කරන ලද සංවර්ධන කටයුතු ද වුයේය. තක්සේරු දෙපාර්තමේන්තුව මෙම විශේෂ ව්‍යාපෘතිවලට අයත් සියලුම ඉඩම් කැබලි හා සම්බන්ධ ඉඩම් අත්කර ගැනීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ කමිටු රැස්වීම් වලට සහභාගි වූ අතර එම දේපළවල තක්සේරු කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබ ඇත. ඉඩම් අත් කර ගැනීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ කමිටු රැස්වීම් වලදී පැන නැගි ආරවුල් සහිත දේපළ ගැටලු නිරාකරණය සඳහා වූ විශේෂ රැස්වීම් වලට ද දෙපාර්තමේන්තුව සහභාගි විය. 2016 වසර තුළ තක්සේරු දෙපාර්තමේන්තුව මෙබඳු විශේෂ රැස්වීම් 391 ක් සඳහා සහභාගි වී අදාළ දේපළ ගැටලු නිරාකරණයෙහිලා සහය වූයේය.

## 2016 වසර තුළ පවරන ලද විශේෂ ව්‍යාපෘති පිළිබඳව ප්‍රාදේශීය වශයෙන් සාරාංශය

| අංකය | වගකිව යුතු ප්‍රාදේශීය නිලධාරීන් | ව්‍යාපෘතිය | කැබලි සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | බටහිර දකුණ | හොරණ - අඟුරුවාතොට -අලුත්ගම | 384 |
| 2 | | පොකුණුවිට - කෝරළඉම | 250 |
| 3 | | කළුවැල්ල - බැල්ලපිටිය | 257 |
| 4 | | වාද්දුව - මොරොන්තුඩුව | 496 |
| 5 | | කොට්ටාව - තලගල | 193 |
| 6 | | බෙල්ලන - මොරගල | 657 |
| 7 | උතුරු මැද | යාන් ඔය | 2696 |
| 8 | | පොළොන්නරුව නගර සංවර්ධන ව්‍යාපෘතිය | 46 |
| 9 | බටහිර උතුර | මධ්‍යම අධිවේගී මාර්ගය | 5277 |
| 10 | ඌව | ලුණුගම්වෙහෙර බෙරලියෙල කතරගම මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 176 |
| 11 | | බදුල්ල -චෙන්කලඩි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 2038 |
| 12 | | උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | 566 |
| 13 | | මොණරාගල ජල විදුලි ව්‍යාපෘතිය | 1184 |
| 14 | | බදුල්ල හාලිඇල ඇල්ල ජලවිදුලි ව්‍යාපෘතිය | 31 |
| 15 | | උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | 1500 |
| 16 | | බලංගොඩ බණ්ඩාරවෙළ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 30 |
| 17 | | බදුල්ල ස්ප්‍රිංවැලි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 96 |
| 18 | සබරගමුව | මධ්‍යම අධිවේගී මාර්ගය | 1210 |
| 19 | | මාදම්පේ රක්වාන මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | 727 |
| 20 | බටහිරමධ්‍යම | වේරුස් ගඟ වැසි ජලය ව්‍යපහරණ ව්‍යාපෘතිය | 1501 |
| 21 | | කිරුළපන ගොඩගම | 400 |
| 22 | | ඔපෙක් 2 මාර්ග ව්‍යාපෘතිය | 3944 |
| 23 | | ඔපෙක් 3 මාර්ග ව්‍යාපෘතිය | 2970 |
| 24 | නැගෙනහිර | කින්නියා තඹලගමුව මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | 185 |
| 25 | | ජේරාදෙනිය - චෙන්කලඩි මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | 44 |
| 26 | | රඹුක්කන් ඔය ජල විදුලි ව්‍යාපෘතිය | 1518 |
| 27 | Metro | මැරයින් ඩ්‍රයිව් මාර්ග ව්‍යාපෘතිය | 170 |
| 28 | | ඔරුගොඩවත්ත අඹතලේ මාර්ග ව්‍යාපෘතිය | 500 |
| 29 | | කැළණිමුල්ල කොස්වත්ත මාර්ග ව්‍යාපෘතිය | 100 |
| 30 | | පාමංකඩ හොරණ මාර්ගය | 445 |

| | | | |
|---|---|---|---|
| 31 | | ශාන්ත සෙබස්තියන් ඇල සංවර්ධන ව්‍යාපෘතිය | 60 |
| 32 | | කොම්පඤ්ඤවීදිය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය | 450 |
| 33 | | මට්ටක්කුලිය පාලම සංවර්ධන ව්‍යාපෘතිය | 175 |
| 34 | | බූත්ගමුව මාර්ග ව්‍යාපෘතිය | 200 |
| 35 | | රාජගිරිය ගුවන් පාලම් ව්‍යාපෘතිය | 25 |
| 36 | වයඹ | මධ්‍යම අධිවේගී මාර්ගය | 6032 |
| 37 | | දැදුරු ඔය ජල විදුලි ව්‍යාපෘතිය | 330 |
| 38 | | පාදෙනිය අනුරාධපුර මාර්ගය | 20 |
| 39 | උතුර | පුලෝලි කොඩික්කාමම් කච්චි මාර්ගය | 213 |
| 40 | මධ්‍යම II | මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 6886 |
| 41 | | ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතිය | 100 |
| 42 | මධ්‍යම I | මධ්‍යම අධිවේගී මාර්ගය | 520 |
| 43 | | A9 මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | 230 |
| 44 | | පේරාදෙනිය කටුගස්තොට මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | 200 |
| 45 | දකුණ | දක්ෂිණ අධිවේගී මාර්ගය | 6436 |
| 46 | | පොල්වත්ත පාලම | 7 |
| 47 | | පොල්අතුමෝදර පාලම | 65 |
| 48 | | ගොවියාපාන පාලම | 22 |
| 49 | | තිහගොඩ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | 66 |
| 50 | | යටියන මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | 100 |
| 51 | | දෙනිය 1/2 පාලම | 2 |
| 52 | | ඉමදූව නගර සංවර්ධනය | 125 |
| 53 | | මොරගොඩ ඇල | 324 |
| 54 | | ගාල්ල බද්දේගම මාර්ගය | 1160 |
| 55 | | බද්දේගම මාර්ගය | 647 |
| 56 | | දේද්දූව සංචාරක ව්‍යාපෘතිය | 200 |
| 57 | | හම්බන්තොට ගන්නොරුව මීගජදුර මාර්ගය | 886 |
| 58 | | මිරිජ්ජවිල සූරියවැව මාර්ග ව්‍යාපෘතිය | 1297 |
| 59 | | වලස්මුල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය | 363 |
| 60 | | වීරකැටිය නගර සංවර්ධන ව්‍යාපෘතිය | 595 |

## තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2016 වසර තුළ ඉටු කරන ලද කඩිනම් ව්‍යාපෘති


සාලාව-කොස්ගම ආයුධ ගබඩාව පිපිරීම

| විෂයාංකය | විස්තරය | දේපළ ගණන |
|---|---|---|
| 1 | ගොඩනැගිලි තක්සේරු | 2106 |
| 2 | ව්‍යාපාරික භාණ්ඩ | 59 |
| 3 | භාණ්ඩ | 1318 |
| 4 | රථ වාහන | 64 |

# III වන කොටස - මූල්‍යමය කාර්යකරණය සහ විශ්ලේෂණය

## *මූල්‍යමය කාර්යකරණ මිණුම් දඬු සහ විශ්ලේෂණය*

| | 2011<br>රු. | 2012<br>රු. | 2013<br>රු. | 2014<br>රු. | 2015<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|---|---|---|
| තත්‍ය ආදායම | 22,981,498 | 32,585,000 | 59,347,000 | 101,280,582 | 53,047,155. | 132,085,894.53 |
| කල්පිත ආදායම | 25,000,000 | 25,000,000 | 30,000,000 | 30,000,000 | 60,000,000 | 60,000,000 |



# IV වන කොටස -අනුමත සේවක සංඛ්‍යාව හා ශ්‍රම සම්පත

සේවක පිරිස් ගිණුම

| තනතුර | සේවය | පන්තිය / ශ්‍රේණිය | වැටුප් කේතය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| රජයේ ප්‍රධාන තක්සේරුකරු | | විශේෂ | එස්.එල්. -3 | 01 | 01 | - |
| අතිරේක ප්‍රධාන තක්සේරුකරු | ශ්‍රී.ලං.ත.සේ. | විශේෂ | එස්.එල්. -3 | 01 | - | 01 |
| නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු | ශ්‍රී.ලං.ත.සේ. | I/I | එස්.එල්. -1 | 04 | 02 | 02 |
| අධ්‍යක්ෂ (පරිපාලන) | ශ්‍රී.ලං.ප.සේ. | I | එස්.එල්. -1 | 01 | - | 01 |
| ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | I | එස්.එල්. -1 | 01 | 01 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ලං.ග.සේ. | I | එස්.එල්. -1 | 01 | 01 | 0 |
| පළාත් තක්සේරුකරු | ශ්‍රී.ලං.ත.සේ. | I/II | එස්.එල්. -1 | 15 | 11 | 04 |
| දිස්ත්‍රික් තක්සේරුකරු | ශ්‍රී.ලං.ත.සේ. | II/I | එස්.එල්. -1 | 60 | 31 | 29 |
| නීති නිලධාරී | | III/II/I | එස්.එල්. -1 | 02 | 01 | 01 |
| ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | III/II/I | එස්.එල්. -1 | 01 | - | 01 |
| පරිපාලන නිලධාරී | රා.කළ.ස.සේ. | අධි පන්තිය | එම්.එන්. -7 | 02 | 02 | - |
| තොරතුරු හා සන්නිවේදන නිලධාරී | ශ්‍රී.ලං.තො.සං.තා .සේ. | 2 පන්තිය II/I | එම්.එන්. -6 | 02 | - | 02 |
| භාෂා පරිවර්තක (සිංහල - දෙමළ) | භා.ප.සේ. | I , විශේෂ | එම්.එන්. -6 | 01 | - | 01 |
| සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු | ශ්‍රී.ලං.ත.සේ. | III/II/I | එම්.එන්. -5 | 360 | 335 | 25 |
| අයවැය සහකාර | ආශ්‍රිත නිලධාරීන් | | | 01 | 01 | - |
| සංවර්ධන නිලධාරී | සං.නි.සේ. | III/II/I | එම්.එන්. -4 | 42 | 25 | 17 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.ස.සේ. | III/II/I | එම්.එන්. -2 | 103 | 92 | 11 |
| තොරතුරු හා සන්නිවේදන නිලධාරී | ශ්‍රී.ලං.තො.සං. තා.සේ. | 3 පන්තිය III/II/I | එම්.ටී. -1 | 03 | - | 03 |
| රියදුරු | රි.සේ. | IIB, IIA, I | පී.එල්. -3 | 18 | 16 | 02 |
| කාර්යාල කාර්ය සහායක | කා.සේ.සේ. | III/II/I | පී.එල්. -1 | 74 | 62 | 12 |
| සංචාරක බංගලා භාරකරු | කා.සේ.සේ. | III/II/I | පී.එල්. -2 | 02 | 02 | - |
| **එකතුව** | | | | 695 | **583** | **112** |

# V වන කොටස - දේපළ වෙළඳපළ සමාලෝචනය

2016 වසර පිළිබඳව සමාලෝචනය කර බැලීමේදී, ශ්‍රී ලංකාවේ ආර්ථිකය විවිධාකාර ගෝලීය හා දේශීය වශයෙන් වූ ආර්ථිකමය හා දේශපාලනමය අභියෝගවලට මුහුණදීමට සිදුවූ තත්වයක් යටතේ ඉදිරි වර්ෂ සම්බන්ධයෙන් එහි ආර්ථික වර්ධනය තුළ අසමතුලිත භාවයක් පිළිබිඹු වූයේ යැයි කිව හැකිය. එසේ වුවද, ශ්‍රී ලංකාව නැගී එන වෙළඳපළවල් අතර ආයෝජනය ආශ්‍රිත ක්ෂේත්‍රයෙහිලා අතිශය උද්යෝගිමත් සීඝ්‍ර දියුණුවක් සහිත කලාපයක් බවට පරිවර්තනය වෙමින් පැවතියේය. ශ්‍රී ලංකාවේ දේපළ ක්ෂේත්‍රයෙහි කෙරෙන ආයෝජන ප්‍රමුඛ දේපළ ආයෝජනය කරන්නන් අතර බෙහෙවින් ජනප්‍රිය වූයේ ය. කොළඹ අග නගරය ශ්‍රී ලංකාවේ සීග්‍රයෙන් වර්ධනය වන්නා වූ මහ නගරයක් ලෙස, විශේෂයෙන් එහි නිශ්චල දේපළ අංශය කෙරෙහි ලොව දස දිග වෙසෙන ආයෝජකයන්ගේ අවධානය දිනා ගැනීමට සමත් විය. ශ්‍ර ලංකාවේ දේපළ වෙළඳපළ ස්වදේශිකයන් හා විදේශිකයන් අතර මෙන්ම මෙරට රැකියාවල නියුතු පිටරැටියන් අතර ද ආකර්ශනීය වෙමින් සුවිශාල වර්ධනයක් අත්කර ගෙන ඇත්තේය.

ලෝක බැංකු වාර්තාවලට අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකය වසර 2010 සිට 2015 දක්වා අතර කාල පරිච්ඡේදය තුළ 6.4%ක් වූ සාමාන්‍ය අනුපාතයකින් වර්ධනය විය. එය සැලකිය යුතු මට්ටමකින් නොකඩවා වර්ධනය වනු ඇත. වසර 2016 තුළ රටේ වඩාත් වැදගත් අංශය වූයේ සේවා අංශයයි. ඊළඟට වැදගත් වූයේ නිෂ්පාදන හා කෘෂිකාර්මික අංශයෝයි. මෑත වසර කීපය තුළ වඩා සැප පහසු දේපළ සඳහා වන විශාල ඉල්ලුමක් සහිතව දිවයිනේ දේපළ වෙළඳපළ ක්‍රමයෙන් වැඩි වර්ධනය වූයේය. නිමවූ හා නිමවෙමින් පැවති සුඛෝපභෝගී ගොඩනැගිලි ඉදිකිරීම් බොහෝ ප්‍රමාණයක් සමග කොළඹ නගරයේ දසුන් පථය පරිවර්තනයකට හසුවෙමින් පැවතියේය.

ඉකුත් 2015 වසර තුළ විදේශ ආයෝජන නැංවීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකා රජය විසින් ඊට හිතකර අයවැය ලේඛනයක් ඉදිරිපත් කළේය. එමගින් ඉඩම් කල්බදු බද්ද ඉවත් කිරීම එහිලා සුවිශාල පියවරක් වූයේය. මෙම යෝජනාව මගින් ශ්‍රී ලංකාවේ දේපළ වෙළඳාම් අංශය තුළ ආයෝජනය කිරීමේ කාර්යය ආයෝජකයන් විෂයයෙහි වඩාත් ඵලදායී එකක් බවට පත් කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කුඩා නගර ආශ්‍රිත දේපළ සම්බන්ධයෙන් වන ඉල්ලුම ඉහළ යනු ඇත. කොළඹ තගරය තුළින් පමණක් දේපළ මිලදී ගැනීමට අපේක්ෂා නොකර මහනුවර වැනි නගර ආශ්‍රිතව ද දේපළ සම්බන්ධ ආයෝජන සොයායෑම දැන් ජනප්‍රිය බවට පත් වෙමින් පවතී. මීට අමතරව, විශේෂයෙන් අඩු ප්‍රසිද්ධියක් සහිත කුඩා නගර හා විශාල නගර ආශ්‍රිත ඉඩම් හා දේපළ මිළදී ගැනීම සම්බන්ධයෙන් සලකා බලන කළ, ශ්‍රී ලංකාව මධ්‍යම පන්තියේ පවුල් වඩ වඩාත් බිහි කිරීමේ නැඹුරුවක් සහිත ප්‍රවනතාවය සහිතව දේපළ මිල ගණන්හී පරාසය ඵලදායී විවිධාංගීකරණයකට භාජනය වී ඇත. මෙම තත්වය ශ්‍රී ලංකාවේ ඉඩම් හා දේපළ වෙළඳපළ විෂයයෙහි සුභ නිමිත්තක් ලෙස සැලකිය හැකිය.

**පී.ඩී.ඩී.එස්. මුතුකුමාරණ**

**රජයේ ප්‍රධාන තක්සේරුකරු**

**තක්සේරු දෙපාර්තමේන්තුව**